(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(17).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 මාර්තු 26 බදාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 29/2025

ගරු බිමල් රත්නායක මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
ගරු අරවින්ද සෙනරත් මහතා
ගරු ඔෂානි උමංගා මහත්මිය
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු සුගත් තිලකරත්න මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු උපාලි සමරසිංහ මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු එරංග වීරරත්න මහතා
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
ගරු සුනිල් රාජපක්ෂ මහතා
ගරු නාමල් කරුණාරත්න මහතා
ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය
ගරු වසන්ත පියතිස්ස මහතා
ගරු කංචන වැලිපිටිය මහතා
ගරු ආර්.ජී. විජේරත්න මහතා
ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
ගරු ගයාන් ජනක මහතා
ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා
ගරු දිනේෂ් හේමන්ත මහතා
ගරු අජිත් ගිහාන් මහතා
ගරු ධනුෂ්ක රංගනාත් මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
ගරු ආනන්ද විජේපාල මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු ඊ.එම්. බස්නායක මහතා
ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
ගරු රියාස් ෆාරුක් මහතා
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු චතුරංග අබේසිංහ මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
ගරු රුවන් මාපලගම මහතා
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු මහින්ද ජයසිංහ මහතා
ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු පද්මසිරි බණ්ඩාර මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
ගරු අජිත් අගලකඩ මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු සුනිල් රත්නසිරි මහතා
ගරු හේමාලි වීරසේකර මහත්මිය
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය
ගරු දේවානන්ද සුරවීර මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
ගරු ලාල් ප්‍රේමනාත් මහතා
ගරු නලින් හේවගේ මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු රුවන් විජේවීර මහතා
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
ගරු ටී.කේ. ජයසුන්දර මහතා
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු කේ. ඉලංකුමාරන් මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
ගරු උපුල් කිත්සිරි මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය

ගරු  අරුණ පනාගොඩ මහතා

ගරු  (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා

ගරු  ඇන්ටන් ජයකොඩි මහතා

ගරු  නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු  තිළිණ සමරකෝන් මහතා

ගරු  ජගත් මනුවර්ණ මහතා

ගරු  (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා

ගරු  (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු  සුනිල් කුමාර ගමගේ මහතා

ගරු  එරංග ගුණසේකර මහතා

ගරු  නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය,— 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 5 වගන්තිය සමඟ කියවිය යුතු 3(ඇ) සහ 3(ඉ) වගන්ති ප්‍රකාරව විෂමාචාරය සහ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සඳහා එකී පනතෙහි 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට වූ යෝජනා සම්මතය පිළිබඳ දැනුම්දීම,— පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් (මෙහි මින් මතු දේශබන්දු තෙන්නකෝන් ලෙස හඳුන්වනු ලබන) එක් කාල වකවානුවක දී බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය  පොලිස්පති  ලෙස කටයුතු කළ හෙයින් ද;

එකී දේශබන්දු තෙන්නකෝන් හිටපු ජනාධිපතිවරයා විසින් 2023-11-21 දින හෝ ඊට ආසන්න දිනකදී  වැඩ බලන පොලිස්පති  ලෙස  පත් කරන ලද හෙයින් ද;

හිටපු ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඔහුව පොලිස්පති වශයෙන් පත්කිරීම අනුමත කර ඇති බව ප්‍රකාශ කරමින් එකී දේශබන්දු තෙන්නකෝන් ඉන් අනතුරුව, 2024-02-26 වන දින සිට බලාත්මක වන පරිදි පොලිස්පති ලෙස පත් කරන ලද හෙයින්ද;

දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස එසේ පත්කිරීම අංක: SC FR 67/2024, SC FR 68/2024, SC FR 71/2024, SC FR 72/2024, SC FR 75/2024, SC FR 79/2024, SC FR 80/2024, SC FR 82/2024 හා  SC FR 84/2024 දරන  මූලික අයිතිවාසිකම් පෙත්සම් නවයක් මඟින් පුරවැසියන් කිහිප දෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කර ඇති හෙයින්ද;

එකී දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති වශයෙන් පත්කිරීමේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න කරමින් ප්‍රබල බැලූ බැල්මට පෙනෙන නඩුවක් ඉහත සඳහන් පෙත්සම්කරුවන් විසින් ගොනු කර ඇති පදනම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉහත කී මූලික අයිතිවාසිකම් අයිතීන් පෙත්සම් ඉදිරියට ගෙන යාමේ අවසරය පෙත්සම්කරුවන් වෙත ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එකී අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු හා සාක්ෂි සමස්තයක් ලෙස සැලකිල්ලට ගනිමින්, එහි 2024-07-24 දිනැති නියමය මඟින් තීරණය කර ඇති බැවින් හා එකී නියමය හරහා  එකී පත්වීම ව්‍යවස්ථාවෙහි අදාළ ප්‍රතිපාදනවලට පටහැනි බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතියමාන කරන හෙයින්ද;

එකී පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද එකී ප්‍රබල බැලූ බැල්මට පෙනෙන නඩුව සැලකිල්ලට ගෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී දේශබන්දු තෙන්නකෝන් විසින් පොලිස්පති ධුරයේ බලතල, කාර්යයන් හා වගකීම් දැරීම වළක්වාලමින්,  එකී නඩු  සඳහා අවසන් තීන්දු ලබා දෙන තෙක් වලංගුවන පරිදි අතුරු නියෝගයක් නිකුත් කිරීමට තීරණය කර ඇති හෙයින්ද;

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද එකී නියමයට අනුකූලව ජනාධිපතිවරයා විසින් ඉන් අනතුරුව පොලිස්පති ධුරයේ බලතල, කාර්යයන් හා වගකීම් ඉටුකිරීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයෙකු පත් කර ඇති හෙයින්ද;

එකී දේශබන්දු තෙන්නකෝන් විසින් පහත සවිස්තරාත්මකව දක්වා ඇති විෂමාචාර ක්‍රියා හා සිය ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධ සිද්ධීන්වල යෙදී ඇති බැවින් පොලිස්පති ධුරය දැරීමට නුසුදුසු තැනැත්තෙකු බවට මේ වනවිට අනාවරණය වී ඇති හෙයින්ද:—

1. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් නම් වශයෙන්; ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලෙම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලීප් ගිහාන් පියතිස්ස යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

2. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් නම් වශයෙන්; ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලෙම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලීප් ගිහාන් පියතිස්ස යන අයගෙන් සමන්විත එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින්ද;

3. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක නියැලීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

4. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලෑන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක නියැලීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින්ද;

5. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති හෙයින් ද;

6. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

7. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

8. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ

වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින් ද;

9. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමේ දෙදෙනෙකු වන පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන අය වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

10. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි එකී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස දේශබන්දු තෙන්නකෝන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින් ද;

11. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරත වන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ළඟම ඇති රෝහලට තුවාලකරුවන් රැගෙන නොගොස් රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

12. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරත වන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර

පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ළඟම ඇති රෝහලට තුවාලකරුවන් රැගෙන නොගොස් රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

13. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

14. බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

15. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

16. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

17. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව, විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

18. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

19. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් වරින් වර නිකුත් කරන ලද වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්ට අනුකූලවීමට අපොහොසත් වී ඇති බවත්, සිදුවෙමින් පවතින නිසි නෛතික ක්‍රියාවලියට හානි කරමින් සැඟවී සිටි බවත්; නීතියේ ආධිපත්‍යය, යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීම ආරක්ෂා කිරීමේ කාර්යය පවරා ඇති පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපයට සහ කීර්ති නාමයට කැළලක් සිදු කළ බවත්; සමස්තයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව සහ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වූ බවත්, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව, විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

20. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන් විසින්, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනියමාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පීරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර

දූලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

21. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනියමාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පීරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දූලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

22. එකී දේශබන්දු තෙන්නකෝන්, මුළු රටේම නීතිය හා සාමය පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇති රටේ පොලිස්පති ලෙස ධුරය දරමින් සිටියදී, ඉහත සඳහන් කළ විෂමාචාර ක්‍රියා එකක් හෝ කිහිපයක් සහ/හෝ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවන් සිදු කිරීමෙන් රටේ පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් කිරීම සහ එමඟින් පොලිස්පතිට නොගැලපෙන ක්‍රියාවක් සිදු කිරීමෙන්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද; සහ

23. එකී දේශබන්දු තෙන්නකෝන්, රටේ පොලිස්පති ලෙස ධුරය දරන අතරතුර, විවිධ ස්වභාවයේ පුළුල් බලතල සහිතව, ඉහත සඳහන් කළ විෂමාචාර ක්‍රියා එකක් හෝ කිහිපයක් සිදු කිරීමෙන් සහ/හෝ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවන් සිදු කිරීමෙන්, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන, රටේ පොලිස්පති ධුරය දරන තැනැත්තෙකුගෙන් අපේක්ෂා කරන උසස් ප්‍රමිතියට අනුකූල නොවීමෙන්, රටේ පොලිස්පති ධුරය දැරීමට නුසුදුසු බවට පත්ව ඇති හෙයින් ද,

යුක්තිය පසිඳලීමේ සමස්ත පද්ධතියේ ස්වාධීනත්වය සහ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ආරෝපණය කරනු ලැබූ වගකීම ඉටු කරනු ලැබිය යුතු වන හෙයින් සාධාරණ හා නිදහස් සමාජයක් නිර්මාණය කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ කාර්යය පැවරෙන ප්‍රාථමික නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්ගෙන් එකක් ලෙස පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව කෙරෙහි මේ රටේ ජනතාව තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා, ඉහත සඳහන් විෂමාචාර ක්‍රියා සහ/හෝ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය කර එහි සොයාගැනීම් වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.